## 34 වන පිටෙන්

අතුරුපසට වැටි එකක්, මෙල්බර්න්වල පෙන්නපු පළමු වතාවේදීම අපට ඉතාම හොඳ ප්‍රතිචාර ලැබුණා. ඒකට තවත් හේතුවක් තමයි, මේ නාට්‍යයට තේමා වුණු කතා සන්දර්භය. ඒක අපේ රට අවුරුදු 30 ක් මුහුණ දුන්න යුද්ධයේ අතුරුවිපාක හා සම්බන්ධ කතා ප්‍රවෘත්තියක්. හොඳ නාට්‍යයක් ලෝකේ කොහේ පෙන්නුවත් බුද්ධිමත් ප්‍රේක්ෂකයා ඉක්මනින් ඒක වැළඳගන්නවා කියලා, අතුරුපසට වැටි එකක් නාට්‍යය අපට ඔප්පු කරලා පෙන්නුවා.

**අතුරුපසට වැටි එකක් නාට්‍යය ගැන අප සිදු කළ සංවාදය අවසන් කරමින් අදහස් පළකළේ ජනප්‍රිය රංගන ශිල්පිනී සුජානි මේනකා දහනායකයි.**

සුජානි, ඔබ රංගන ක්ෂේත්‍රයට සම්බන්ධ වෙළා දැන් සෑහෙන කාලයක් වෙනවා. ඒත් ඔබ දැන් තමයි හා හාපුරා කියලා වේදිකා නාට්‍යයකට රංගනයෙන් දායක වෙන්නේ. කාලෙකට පස්සේ මේ ගත්ත තීරණය ගැන ඔබ මොකද හිතන්නේ ?

ඔව්, මම පළමු වතාවට තමයි මේ ප්‍රසිද්ධ වේදිකාවට සම්බන්ධ වෙන්නේ. ඒ ගයාන් කණිෂ්කගේ අතුරුපසට වැටි එකක් කියන වේදිකා නාට්‍යය ඔස්සේ.

ප්‍රසිද්ධ වේදිකාවේ රඟපාන්න මෙතෙක් කල් මට අවස්ථාවක් නොලැබුණාට වේදිකාව කියන්නේ මගේ ප්‍රියතම කලා ක්ෂේත්‍රයක්. මං පාසල් කාලෙදී පාසල් වේදිකා නාට්‍ය රැසක රඟපාලා තියෙනවා. නමුත් මම ප්‍රසිද්ධ රංගන ශිල්පිනියක් විදියට ආරම්භයේ ඉඳලම රූපවාහිනියට සම්බන්ධ වෙළා වැඩ කරපු නිසා, වේදිකාව මට සම්පූර්ණයෙන්ම වගේ මග හැරිලා ගියා. ඒත් සෑහෙන කාලකෙට පස-ස් හරි මට



ප්‍රසිද්ධ වේදිකාවේ රඟපාන්න අවස්ථාවක් උදාවීම ගැන මං ගොඩක් සතුටු වෙනවා. ඒ ගැන මං ගයාන් කණිෂ්කට මුලින්ම ස්තූතිවන්ත වෙනවා.

මට දැන ගන්න ලැබුණා මේ නාට්‍යය මීට කලින් එක් වතාවක් ඕස්ට්‍රේලියාවේ වේදිකාගත වුණා කියලා. නමුත් මම මේ වතාවේ තමයි මුල්වරට මේ නාට්‍යයට සම්බන්ධ වෙන්නේ. මම නාට්‍ය පිටපත හොඳින් කියවලා බැලුවා. ඒක හරිම සංවේදී සිදුවීම් මාලාවක් වටා ගෙතෙන කතාවක්. ඒ වගේම අලුත් විදියේ නාට්‍ය ආකෘතියක්. බැලූ බැල්මට ලොකු අභියෝගයක් වගේ පෙණුනත්, පිටපත හොඳින් කියවගෙන යනකොට මට තේරුණා මේක මට කරන්න පුළුවන් කියලා. අනික කණිෂ්කගේ පිටපතේ ලොකු ගැඹුරක් තියෙනවා කියලත් මට වැටහුණා. ඔහු මේ නාට්‍යය හරහා සමා-ජයට ප්‍රබල පණිවිඩයක් දෙන්න උත්සහ කරනවා. ටෙලි නාට්‍යය රංගනයෙන් තරමක් අත්මිදිලා තරමක විවේකයෙන් පසුවන මේ වකවානුවේ, වේදිකා නාට්‍යයකට සම්බන්ධවීම ලැබීමත් මට හොඳ අවස්ථාවක් කියලා මම හිතුවා.

ඒ වගේම කියන්න ඕන, මහේන්ද්‍ර පෙරේරා, දුලීකා මාරපන, ජගත් චමිල වගේ ප්‍රවීණ නළු නිළියන් පිරිසක් එක්ක වේදිකාවේ එකට රඟපාන්න ලැබෙන එකත් මගේ රංගන ජීවිතයට ලොකු ආලෝකයක්, ඒ වගේම ඒක මට ලොකු අත්දැකීමක්. ඇත්තෙන්ම මේ කටයුත්තෙදි ඔවුන් මට ලොකු ශක්තියක්.

මං බලාපොරොත්තු වෙනවා, මගේ උපරිම රංගන හැකියාව, අතුරුපසට වැටි එකක් හරහා ඕස්ට්‍රේලියාවේ ඉන්න ප්‍රේක්ෂකයන්ට ප්‍රදර්ශනය කරන්න. ඒ එක්කම මං ඕස්ට්‍රේලියාවේ ඉන්න අපේ ශ්‍රී ලාංකික හිත මිත්‍රයෝ හැමෝටම ආරාධනා කරනවා, මේ නාට්‍යය නරඹන්න නොවරදවාම එන්න කියලා.

ගායන් කණිෂ්ක රාජපක්ෂ විසින් වේදිකා පිටපත ලියා අධ්‍යක්ෂණය කළ, අතුරුපසට වැටි එකක් නාට්‍යයේ ප්‍රධාන චරිත නිරූපණය කරන, මහේන්ද්‍ර, දුලීකා, ජගත් සහ සුජානි, සිය කාර්යබහුල ජීවිතයෙන් සුළු වේලාවක් හෝ අප වෙනුවෙන් වෙන් කිරීම ගැන අපි ඔවුනට බෙහෙවින් ස්තූතිවන්ත වෙමින් ඔවුන් හා පැවැති සුහද සංවාදය එතෙකින් හමාර කළෙමු.



ලෝකයේ කොතැනක දිව ගෙවුවද, ශ්‍රී ලාංකික හද ගැස්මට නිරතුරු සවන් දෙන, මව්බිමේ සංවේදනාවන් මනසින් හෝ අත් විඳින ගයාන් කණි-ෂ්ක රාජපක්ෂ වැනි නව්‍යවාදී ශ්‍රී ලාංකික නිර්මාණක-රුවන් ගැන අපි ද බොහෝ සේ ආඩම්බර වෙමු.

## 15 වන පිටෙන්

**"නිකං දෙනදේ අගයක් නෑනේ සිලී...**ඒ හින්දා කීයක් හරි ගමු" තාත්තා කියනු ඇසේ. බව බෝගයෙන් සරුවේගන එන කල මගේ හිතේ එක් එක් අදහස් පහළවේ. දහවල් ආහාරයෙන් පසු පැයක් දෙකක් පමණ නින්දට යෑම අම්මා ගේ සිරිතයි. මඳ වේලාවක් නිදාගත් පසු ඈ දවසේ ඉතිරි වැඩ කටයුතු රාත්‍රී නින්ද දක්වාම කරගෙන යනු ලබයි. අම්මා නින්දට යනතෙක් මා බලා සිටින්නේ මහත් නොඉවසිල්ලෙනි.

ඇය නින්දට යන යාමයේ වත්තේ ගේට්ටුව පැත්තට මා එබිකම් කරන්නේ කවුරුන් හෝ යමක් ඉල්ලීමට ඒදෝ සිත සිතාය. කොයි එකටත් කියා පිඟි තලයක්ද මයියොක්කා ගස් අසල සඟවා තැබීමි. දිනක් **මිසි නැන්දා** ගේට්ටුව අසලට පැමිණ" බබෝ අම්මා ඉන්නවද?...මට මයියොක්කා ටිකක් ගන්ඩ ඕනෑ" යැයි කීය. "අම්මා ගෙදර...මිසි නැන්දට මම අල ටිකක් ගලෝලා දෙන්නම්කෝ" කියා හොඳට අල බැසූ පඳුරක් ගලවා දුනිමි. ඈ මා අත ශත හැත්තෑ පහක් තැබුවාය.

ඇය මේ වෙලාවම බලා අම්මා ගැන අසා පැමිණියේ මට කියා සුළු මුදලකට වැඩි ප්‍රමාණයක් ගන්නට බැව් මා දන්නවාය. දැන් ඒ ගණුදෙනුව හමාරය. වහවහා ක්‍රියාත්මකවූ මා අල ගැලවූ මයියොක්කා පඳුර යළි රෝපණය කරන්නේ කිසි කෙනෙකුට නොදැනෙන්නටය. ශත හැත්තෑ පහක මුදලක් මට සරුංගලයක කොළ නූල් ගන්නට ප්‍රමාණවත්ය.

මා ඒ මුදල් සඟවා තබාගෙන "සරුංගල කොළ, නූල් ගන්නට කොහෙන්දැයි සල්ලි"යි අම්මා අසනා විට..."යාළුවන්ට සරුංගල තට්ටු හදා දීලා ගත්ත සල්ලි"යි මුසාවක් කියන්නට පුරුදුවී සිටිමි. සරුංගල තට්ටු සෑදීමේ සමත් කමක් ඇති මා හට මේ කියනා දේ ඈ විශ්වාස කොට සැළකුවාය.

කරනා කියනා දේවල් එතරම් බරක් පතලක් නොගන්නා මා එදවස කල දේවල් මෙනෙහි කරනවිට ළමා කාලයේ හුන් සියල්ලටම මෙවැනි අත් දැකීම් තියෙන්නට ඇතැයි මට දැන් සිතේ. මයියොක්කා ගෙදරට හොරා විකිණීම හැමදාම කරන්නට බැරිය.

මේ මජර වැඩේ නම් කවදා හෝ අතටම අසුවේ යයි විශාල බියක් ගෙන දෙමින් දවස් ගෙවීයයි. දිනක් පැළවලට වතුර දමන අතරතුරේ තාත්තා අම්මාට අත දිගුකොට යමක් පෙන්වයි.

"පේනව නේද සිලී...අර මයියොක්කා පඳුරේ නම් අල බැහැලා ඇති හොඳට...ඒකනේ අර කොළේ කහ පාට ගහගෙන එන්නේ"... තාත්තා එසේ කියනාවිට මගේ හදවතේ ධාවනය වැඩිවේ. වතුර බෙලෙක්කයේ වතුර මා'තින් පැළයට නොවැටී වෙනතක හැළේ. දැන් අසුවේදෝ... දැන් අසුවේදෝ යන බියෙන් සසල වේ. තාත්තා වෙර යොදා මයියොක්කා පඳුර ඇදී.

පඳුරත් සමග ඔහු බිම ඇදවැටෙන්නේ සවියක්, මුලක් නැති ලී දණ්ඩක් ඇද්දාක් මෙනි. "මදෑ...පෙනේද සිලී...වැඩේ හරියන්නෙ නෑ. ඌරුමීයෝ බෝවෙලා කාලානේ ඔක්කොම...මේන්..මේ..දත් ගහලා හරියට පිහියෙන් කැපුවා වාගෙ. මා පිහියෙන් කැපූ පහරවල් හොඳ හැටි පෙනේ. මගේ හිත යටින් බිය මෙන් ම සිනහව ද නැගේ.
"ඒ උනාට අනේ ඌරුමීයෙක් හාරන් ආවානම් ගුහාවක් තියෙන්න එපායැ...මෙහෙම කොහොමද වෙන්නේ" අම්මා කියන්නේ විමතියෙනි.

නෑ...සිලී මුන් හරි කට්ටයි. අල ටික කාලා පහුරු ගාලා වහලා යනවා" මා කල වැඩේ ගෙදරට අසු නොවී ගැලවීමත්, තාත්තා ගේ ඒ කියමනත් මඳකට හෝ හිතට සැනසිල්ලක් ගෙනදේ. ටික දිනක් යනවිට මේ නරක පුරුද්දෙන් මා සමුගතිමි.

සරුංගල වාරයද අවසන් වී වෙනත් වෙනත් විනෝදාංශවල යෙදෙන්නට වූ කාලයයි මේ. පාසැල ඇරී ගෙදර ආපසු කෑම කා අහල පහල මිතුරන් හා ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදෙන්නට ගියේ අම්මාගේ බලවත් අකමැත්ත මතය. තාත්තා එන්නට පෙර, ඇඳිරි වැටෙන්නට පෙර ගෙදර එන්න යැයි ඈ කියන්නේ පොතක පතක ඉගෙනීමක් ද අවැසි නිසාය.

සිංහල අළුත් අවුරුද්ද ලංවන විට තාත්තා ගෙවත්තේ ම පැසුනු කෝලිකුට්ටු හෝ ආනමාලු කෙසෙල් කැනක් කපා ගෙට ගෙනැවිත් ගෝනියක ඔහා ගබඩා කාමරයේ ඇති ඇඳ යටට දමනවාය. මෙවන් කාලයක වේලාපහින් ම සූදානම් වන්නේ කෙසෙල් ඇවරි කපා අහල පහල ගෙවල් වලට බෙදීමටත්, අවුරුදු තේ මේසයට ගැනීම සඳහාත් ය.

අවුරුදු දින ලං ලං වෙද්දී මට ඇඳයට කෙසෙල් කැණ මතක් වේ. විටින් විට මට එයින් නැගෙනා සුවඳ නැහැයට ගෙන දෙන්නේ මහා වදයකි. කාටත් හොරා ඇඳයට ට රිංගා ගන්නා මා ඉන් කෙසෙල් ගෙඩි කීපයක් ගිල දමා කෙසෙල් ලෙළි ද ගෝනිය තුලට දමා එන්නට පුරුදු ව සිටියෙමි.

දවස් දෙක තුන යනවිට කෙසෙල් කැණ පිළිබඳ වගකීම මා සම්පූර්ණ කොට හමාරය. කෝලිකුට්ටු වැඩි පුර කෑමෙන් මට රෝගයක් ද උත්සන්න වී ඇවිදින්ය. ඒ වැසිකිළියාමේ අපහසුතාවයෙන් ය. නමුත් අම්මා ට කෙසේ කියන්නද? බඩ රිදිල්ල අල්ලනවාය කියා **"නොන්ඩි වෙදමහතා"** ගෙන් ගෙනා බෙහෙත් ගුලි දෙකක් දෙහි ඇඹුලින් උරච්චි කර බොන්නට දෙන්නට කියන්නේ ඉවසා ඉන්නට බැරිම තැනය.

"පේනවනේ...එක එක ජරාවල් කාලා දැන් බඩ රිදිල්ල...පේර ගහේ ගැටේ ඉඳලා කනවා...ඔච්චට පණුවො ඇවිස්සෙනවා. හෙට අනිද්දා හොඳ දවස් එන්නේ...ලෙඩ හදා ගත්තාම අපිටමයි වදේ" අම්මා තරහින් පුපුරමින් සාත්තු කරයි. "සිලී...ඕන් ගානට කෙහෙල් කැණ ඉදිලා...කොහොමද සුවඳ" තාත්තා ඇඳ යටට එබෙමින් කියනා විට බඩේ රිදිල්ල දෙගුණ තෙගුණ වේ. තාත්තා කෙසෙල් කැණ දැමූ ගෝනිය එළියට ඇදලා ගන්නාවිට අම්මා ගේත් තාත්තා ගේත් ඇස් උඩ යැවෙන ආකාරයත් මගේ දෙකකුල් ගැහෙන ආකාරයත් දැනිදු සිහිවේ.

"පෙනේද පුතංඩියා කරලා තියෙන හරිය...කෙසෙල් කැණම කාලනේ...ඒ මදිවට ලෙලිත් ඇතුලටම දාලා. මේ ජරා පුරුදු කාගෙන්ද ඉගෙන ගෙන තියෙන්නේ...මිනිස්සු දන්නවානම් හිතාවි මේ ළමයිට කන්න බොන්න දෙන්නෙ නෑ කියලා... අම්මා ගේ බැණුම් මැද, මා ඇඩිල්ල අතර තුර ඇගිල්ල දිගු කරන්නේ ඉන් වැඩි හරියක් කා ඇත්තේ අයියා ය කියා කියන්නටය.

එනමුදු ඔහු මේ එක කෙසෙල් ගෙඩියකට හෝ අතක් නොතැබූ බව මට විශ්වාසය. මක් නිසාදයත් සියල්ලම ගිල දැමුවේ මා බව දන්නා නිසාවෙනි.

"දැන් කරන්න දෙයක් නෑ සිලී...වෙලාවක් නෑ දුම් ගහලාවත් කැණක් ඉදවා ගන්නඩ... පොළෙන්වත් කෙසෙල් ඇවරි ටිකක් ගේන්ඩ වෙනවා" බලාපෙරොත්තු සුන් මුහුණින් තාත්තා අම්මාට කියනු ඇසේ.

"ඔව් ඔය බඩරිදිල්ල වෙන මොනවත් හින්ද නොවෙයි.වැසිකිලි යන්නෙ නැතිව.. කෝලිකුට්ටු උෂ්ණයි...බඩ වේලනවා...හොඳ වැඩේ අර ඇටිකෙහෙල් කාපු උගුඩුවාගෙ අනිත් එක මේ වෙලා තියෙන්නේ...අම්මාගෙන් බැනුම් කන්දරාවකි. එදා දවසේ බැනුම් අස්සේ ඇසූ "**ඇටිකෙහෙල් කාපු උගුඩුවාගෙ කතාව**" පසු කලෙක දී විස්තරාත්මක ව අම්මාගෙන් දැන ගතිමි.

පාසලේ වැඩ කටයුතු කරගෙන යාමේ දී හැම විටෙක ම සුබදායී ප්‍රතිපල අත් විඳින්නට මට වාසනාව උදාවිය. පහේ පන්තියේ පටන් ගැන්මේ සිට කලා කටයුතු හා භාෂා සාහිත්‍යයේ දක්ෂතා බොහෝ දුරට වැඩි දියුණුවිය. එහි ස්තුතිය පුදන්නට ඕනෑ මගේ අයියාට ය. විද්වත් ලේඛකයන් ගේ, දාර්ශනිකයන් ගේ පොත පත ඇසුර නිසා මා ද ඔහු ගෙනෙනා පොත පත අකුරක් නෑර කියවන්නට ගත්තේ මෝස්තරයකට මෙනි. සමහර අවසථාවල දී **"ටොකු"** සංග්‍රහයකින් ද සංග්‍රහ ලැබීමි. මන්දයත් ඔහු හිතවතුන් ගෙන එන පොත්වල පිටුපස පිටෙහි පොතේ කතා වස්තුවට අදාළ චිත්‍රයක් පැන්සලෙන් කුරුටු ගෑම නිසාය. එකල මා සිතුවේ පොතේ හිමිකරුවා එය අගය කොට සළකන්නක් ලෙස කියාය.

කෙසේ හෝ පොත් පිටුපස කුරුටු ගෑම නවතා දැමුවත් අයියා ගෙනෙනා පොත පත කියවීම නවතා දැමුවේ නැත. මෙසේ කල් ගතවෙද්දී අයියා ගේ පොත් කියවීමේ විලාසයේ මට අමුත්තක් දැනෙයි. ගෙදර අය නිවෙසින් බැහැර වන අවසථා වල, නිදාගන්නට යනවිට හොර රහසේ ඔහුගේ පොත් කියවීම පටන් ගැනේ. ඒ කියවන පොත මට පසු දා ඔහු ගේ පොත් රාක්කයෙන් සොයා ගත නොහැක. මෙය මට මහත් ප්‍රහේලිකාවකි. දවස් කීපයක් ම විමසිල්ලෙන් සිටි මා හට ඔහු නිදන ඇඳේ මෙට්ටය යට තිබී මේ අපූරු කතා වස්තුව හමුවෙයි.

**"ගෝණුස්සා"බ්‍රිගේඩියර් එම්...** මාරක කතා චක්‍රවර්ති **ඩීමන් ආනන්ද...මිළ ශත 55 යි. ආනන්ද පොත්හල මරදාන.** එහි සඳහන් වෙයි. ඇතුලත පිටුවෙහි මෙසේ ලියා ඇත. (**භීතියට භීතියකි...ඇසට ඇසකි...උණ්ඩයට උණ්ඩයකි...පළියට පළියකි...ලෙයට ලෙයකි**) යනුවෙනි. මේක නම් "මාරම පොතක්"හිතින් මිමුණු වෙමි. ගෙදර උදවිය එහා මෙහා වෙන ලද අස්වැසිල්ලෙන් මේ පොත් පිංච එක හුස්මට කියවා දැමීමි. ත්‍රාසය,භීතිය,කුතුහලය දනවන මේ පොත් පිංචවල් අයියාට හොරා කියවන්නට හිත ඇළුම් කළේය. හොර රහසේ කියවන මේ පොත් වෙනත් පොත් වලට වඩා කියවීමේ උද්දීපනයක් ගෙන දෙන්නක් විය.**"බුකිපුලා මිනී වළෙන් නැගිටී" ගොල්ගොතා ගේ ශාපය"** පොත් කියවා මට හවස 6 න් පසු එළියකට පහළියකටවත් නොබැස ඉන්නට මහත් බියක් ගෙන දුනි. **ඩීමන් ආනන්ද** ගේ මාරක කතා නිසා කියවීමේ රසය, ආශාව තව තවත් වැඩි වුනි. ඒත් බොහෝ කලක් යන්නට මත්තෙන් අයියා ගේ දකුණත මාගේ කණ හරහා පියා සැළුවේය.

මෙය ගෙදරට සැළවීම දෙදෙනා ම පෝරකයට නියම වීමක් ලෙස සැළකිණ. එදවස ඩීමන් ආනන්ද ගේ පොතක් කියවනවාය යනු තරුණ ළමයි බොහෝ පරිස්සම් කරගත යුතු යැයි දෙමාපියන් සිතුවෝය. එනමුත් රටේ ආන්දෝලනයක් ඇති කල මාරක කතා රචකයා ඩීමන් ආනන්දය. මොනයම් මත විවාද දැරුවත් ඩීමන් ආනන්ද ගේ මේ පොත් පිංචක් නොබැලූ කෙනෙක් එදවස සොයාගන්නටවත් බැරිය. විවිධ තරාතිරමේ පුද්ගලයන් මෙන් ම රටේ ප්‍රභූ පිරිස් ද ඩීමන් රසික පිරිස් බව නොරහ-සකි.

කෙසේ වෙතත් මාරක කතා රචක ඩීමන් ආනන්ද මාගේ කියවීමේ කලාවේ එක්තරා සිහිවටනයකි

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com